2024-04-26

# <u>මාධ්‍ය නිවේදනය</u>

ඉරාන ජනාධිපති ආචාර්ය ඊබ්‍රහිම් රයිසි මැතිතුමා වෙනුවෙන් පැවැති රාත්‍රී භෝජන සංග්‍රහයට විපක්ෂ නායකතුමා සහභාගි නොවීම පිළිබඳව වැරදි මතවාදයක් සමාජගත කිරීමට ආණ්ඩු හිතවාදී මාධ්‍ය දරණ දේශපාලනික උත්සාහය තරයේ හෙලා දකිමු.

ඉරාන ජනාධිපතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර එතුමා හමුවීමට විපක්ෂ නායකතුමා කැමැත්තෙන් සිටින බව විපක්ෂ නායක කාර්යාලය විසින් ඉරාන තානාපති කාර්යාලය දැනුවත් කිරීමක් ද සිදු කරන ලදී.

එසේ තිබියදී ඇතැම් මාධ්‍ය මගින් සිදුකරන මාධ්‍ය මෙහෙයුම් මගින් ඉරාන ජනාධිපතිතුමාට විරෝධය දැක්වීමක් ලෙස රාත්‍රී භෝජන සංග්‍රහයට සහභාගි නොවූ ලෙස හුවා දැක්වීමට උත්සහ දැරීම පදනමකින් තොර කරුණකි.

විපක්ෂ නායකතුමා භෝජන සංග්‍රහයට සහභාගි වූයේ නම් එය “රනිල්-සජිත් දේශපාලන ඩීල් එකකට සූදානම්” යැයි අවලාදයක් ද නිර්මාණය කොට එළි දැක්වීමට මෙම මාධ්‍ය මෙහෙයුම්කරුවන් සූදානම්ව සිටි බව ද අනාවරණය වීම මෙම තීරණය ගැනීමට තවත් හේතුවක් වූ බව ද සඳහන් කරමු.

සමගි ජන බලවේගය ලෙස ගරු ඉරාන ජනාධිපතිතුමා සහ ඉරාන ජනතාවට ශ්‍රී ලංකාව සමග අඛණ්ඩව පවත්වනු ලබන මිත්‍රත්වය අපි සැමදා අගය කර සිටිමු.

මාධ්‍ය අංශය
විපක්ෂ නායක කාර්යාලය

සමගි ජන බලවේගය, නො. 592, බංගලා හන්දිය, කොට්ටේ පාර, පිටකොට්ටේ.
ஐக்கிய மக்கள் சக்தி, இல. 592, பங்களா சந்தி, கோட்டே வீதி, பிடகோட்டே.
Samagi Jana Balawegaya, No. 592, Bangala Junction, Kotte Road, Pitakotte.
+94 11 287 0211 / +94 11287 0212 +94 11287 8440 generalsecretarysjb@gmail.com

Activate Windows